# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>**My No** | DSD/HO/05/MF/01/Covid 19 | ඔබේ අංකය<br>உமது இல<br>**Your No** | ........................................... | දිනය<br>திகதி<br>**Date** | 2021.05.12 |

**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති විධායක කමිටු / බැංකු පාලක මණ්ඩල සභාපතිවරුන්,**

**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති / සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්,**

<u>**සමෘද්ධි බැංකු කටයුතු සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් අනුව අඛන්ඩව පවත්වා ගැනීම හා සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම සලසා ගැනීම.**</u>

2021.05.09 දින පැවති ආර්ථික පුනර්ජීවන හා දරිද්‍රතාව තුරන් කිරීමේ ජනාධිපති කාර්ය සාධන බලකායේ රැස්වීමේ දී ලබා දුන් උපදෙස් පරිදි සමෘද්ධි බැංකු කටයුතු අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස සලකා සෞඛ්‍ය උපදෙස් අනුගමනය කරමින් අඛන්ඩව පවත්වාගෙන යා යුතුව ඇත. ඒ අනුව සෞඛ්‍ය උපදෙස් අනුගමනය කරමින් සමෘද්ධි බැංකු විසින් ප්‍රතිලාභීන් සඳහා අවශ්‍ය සේවා ලබා දිය යුතු වේ.

ඉහත රැස්වීමේ දී ලබා දුන් උපදෙස් අනුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් 2021.05.12 දිනැතිව නිකුත් කල මාධ්‍ය නිවේදනය පරිදි මූල්‍ය ආයතන තම ගණුදෙනුකරුවන්ට සේවා සැපයීමේ දී , තම කාර්යාල තුල දැනට පවතින ඉඩකඩ ප්‍රමාණයෙන් 25%ක් භාවිතා වන පරිදි හා මීටර් 1.5 ක් වන පරිදි පුද්ගල දුරස්ථභාවය සහිතව අදාල සේවා පවත්වා ගත යුතු බවට දන්වා මෙම උපදෙස් 2021.05.12 සිට 2021.05.31 දින දක්වා බලපවත්වන බව ද එම නිවේදනයේ සඳහන් කර ඇති බැවින් ඒ අනුව අප බැංකු පද්ධතිය ද කටයුතු කල යුතු වේ.

අංක DSD/HO/05/MF/01/චක්‍රලේඛ හා 2020.10.19 දිනැතිව නිකුත් කල සමෘද්ධි බැංකු චක්‍රලේඛ 2020/15 අනුව Covid 19 වසංගත තත්ත්වය පවතින කාලවකවානු වල සමෘද්ධි බැංකු කාර්යය මණ්ඩලය හා ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලයට අවශ්‍ය ආරක්ෂිත උපකරණ හා ද්‍රව්‍ය මිල දී ගැනීම් සඳහා මසකට රුපියල් 50,000/-ක් දක්වා වැයකල හැකිබව දන්වා ඇත. කෙසේ නමුත් මෙම උපදෙස් අනුව සමහර සමෘද්ධි බැංකු අවශ්‍ය ආරක්ෂිත ද්‍රව්‍ය බැංකුව වෙත හා ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලයට ලබා නොදී ඇති බව ද වාර්තා වී ඇත.

වර්තමානයේ පවතින Covid 19 ව්‍යසනකාරී තත්ත්වය තුල , ලබා දී ඇති උපදෙස් අනුව බැංකු කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීමටත් අදාල නිලධාරීන්ගේ හා බැංකු පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගේ සෞඛ්‍ය


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

ආරක්ෂිත බව සලසා ගැනීමටත් 2020/15 සමෘද්ධි බැංකු චක්‍රලේඛ උපදෙස් අනුව අවශ්‍ය කටයුතු ඉටු කරන ලෙස මෙයින් අවධාරණය කරමි. එසේ ම විශේෂ තත්ත්වයකදී මෙම සෞඛ්‍ය ආරක්ෂිත ද්‍රව්‍ය මිලදී ගැනීමේ දී රුපියල් 50,000/-ක මුදල ප්‍රමාණවත් නොවන්නේ නම් අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) විමසා අනුමැතිය ලබා ගෙන අවශ්‍ය වියදම් කළ හැකි බව ද වැඩි දුරටත් කාරුණිකව සඳහන් කරමි.

Covid 19 ප්‍රතිශක්තිකරන එන්නත සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ට ලබා දෙන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් දැනටමත් ඉල්ලුම් කර ඇත. දැනට රජය විසින් ගෙන යනු ලබන කඩිනම් එන්නත්කරන වැඩපිළිවෙළ යටතේ සුදුසු පරිදි අප දෙපාර්තමේන්තු නිලධාරීන්ට ද එන්නත ලබා දෙන ලෙස ඉහත ජනාධිපති කාර්යය සාධන රැස්වීමේදීම සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත උපදෙස් දෙන ලදී.

Covid 19 වසංගත ව්‍යවසන තත්ත්වය තුල සමෘද්ධි බැංකු සේවය අඛණ්ඩව පවත්වා ගැනීමට ඔබ දක්වන සහයෝගය පිළිබඳ කෘතඥ වෙමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත්:-**

1. ලේකම්, සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ස
2. දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් , දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ , දිස්ත්රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
5. ප්‍රාදේශීය ලේකම්වරුන් , ප්‍රාදේශීය ලේකම් කාර්යාල - කා.දැ.ස
6. දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂ , දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.